**ශ්‍රී ලංකා පදනම - 2013**

**-------------------------**

ශ්‍රී ලංකා පදනමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 31 දරන ශ්‍රී ලංකා පදනම් පනතේ 13(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා

ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබූ රු. 63,400 ක් වූ ස්ථාවර වත්කම් සහ රු.76,882 ක් වූ ලිපිද්‍රව්‍ය අල්මාරිය පුනරාවර්තන වියදම් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත්, දැනට භාවිතයට ගන්නා පිරිවැය රු. 12,426,541 වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ.757 (1) (ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2014 සැප්තැම්බර් 12 දින |

| | |
|---|---|
| | ඉදිරිපත් කර තිබූ අතර භෞතික ශේෂය ගබඩා පොත් සමඟ සසඳා ඌණතා/අතිරික්ත දක්වා නොතිබුණි. |
| (ආ) 2009 සැප්තැම්බර් 18 දිනැති හා අංක PF/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සතු වාහන ජාතික රක්ෂණභාර අරමුදල වෙතින් හෝ සීමාසහිත රක්ෂණ සමාගමෙන් රක්ෂණාවරණ ලබාගත යුතු වුවත්, ආයතනය සතු වාහන එකී චක්‍රලේඛයට පටහැනිව රු.510,359 ක් ගෙවා පෞද්ගලික රක්ෂණ ආයතනයකින් රක්ෂණය කර තිබුණි. |
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති හා අංක 8 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br><br>5.4.4 (1) වගන්තිය | පිළිගත හැකි අත්තිකාරම් සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත සියයට 20 ක උපරිමයක්, අත්තිකාරමක් වශයෙන් ගෙවිය හැකි වුවත් උක්ත චක්‍රලේඛයට පටහැනිව ආයතනය විසින් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 40 ක් එනම් රු.107,496 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. |

**2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------------

ආයතනයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ අධ්‍යක්ෂවරයකුගෙන් අයවිය යුතු රු.253,989 ක මුදලක් 2006 වර්ෂයේ සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

--------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මෙහෙයුම් කටයුතු වලින් පසු රු. 5,897,396 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,083,994 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,981,390 ක වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ වෙනත් ආදායම් රු.53,687,100 කින් වැඩිවීම වේ.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

ඩිප්ලෝමා පාඨමාලා දෙකක සේවා යෝජක අනුග්‍රහය නොලබන සිසුන්ගෙන් පාඨමාලා ගාස්තු නිසි පරිදි අයකරගෙන නොතිබුණි.

**4.2 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්**

**----------------------------------------------------------------**

පදනම් ආයතනයේ අංශයක් වශයෙන් ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය 2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතට පත්කොට තිබූ අතර 2011 නොවැම්බර් මාසයේදී එම අංශය සතු සියලුම වත්කම් අමාත්‍යාංශයට පවරා දී තිබුණි. කෙසේ වුවද රු.36,653,585 ක් වටිනා අභ්‍යාස ආයතනය පිහිටා ඇති ඉඩම හා ගොඩනැගිල්ල තවදුරටත් ආයතනයේ වත්කමක් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

**4.3 හඳුනාගත් පාඩු**

**----------------**

ආයතනය හා පෞද්ගලික සමාගමක් අතර ඇති වූ නඩු නිමිත්තක බේරුම්කරන තීන්දුව අනුව තීන්දුව ලබා දුන් 2013 දෙසැම්බර් 07 දින සිට දින 35 ක් ඇතුලත ආයතනය විසින් සමාගමට රු.1,159,525 ක් ගෙවිය යුතු වුවද, එය විගණිත දින වන තෙක් ගෙවා නොතිබුණි. බේරුම්කරන තීන්දුවට අනුව, එම සමාගම සමඟ ඇති කරගෙන තිබූ මුල් ගිවිසුමේ 60 (7) වගන්තියේ විධිවිධාන අනුව පදනම් ආයතනයට ප්‍රමාද පොළියක් ගෙවීමට සිදුවන බව දක්වා තිබුණද, එම ප්‍රමාද පොළිය නිවැරදිව ගණනය කිරීම සඳහා ප්‍රතිපාදනයන් ගිවිසුමේ නොතිබුණි.

**5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**-----------------------------------------**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

**-------------------**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබූ බැවින් අපේක්ෂිත ඉලක්ක හා කාර්යසාධනය සැසඳිය නොහැකි විය.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති පාඨමාලා 38 කින් වර්ෂය තුළ පවත්වා තිබුණේ ඩිප්ලෝමා 6 ක් හා සහතික පත්‍ර පාඨමාලා 10 ක් පමණි.

**6. පද්ධති හා පාලනයන්**

**-----------------------**

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ අඩුපාඩු වරින්වර පදනමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) මිලදී ගැණුම්

(ආ) ණය ගැතියෝ

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඈ) පාඨමාලාවල ආදායම් රැස්කිරීම